CSR
centre for society and religion

# 5 වසරක්

# පාස්කු ඉරිදා ප්‍රහාරයට යුක්තිය නැතුව වසර පහක්

## දේශපාලන, සමාජ-සංස්කෘතික, ආර්ථික  සහ නීතිමය ඇසින්


සමාජය සහ සාමයික කේන්ද්‍රය
පර්යේෂණ කණ්ඩායම





# මූලික සාරාංශය

2019 අප්‍රේල් 21 වැනි දින සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ක්‍රිස්තියානි දේවස්ථාන තුනක්, සුඛෝපභෝගී හෝටල් තුනක්, නවාතැන්පළක් සහ නිවසක්[1] ඉලක්ක කරන ලද අතර එය යුද්ධයෙන් පසු මෙරට සිදු වූ කුරිරුතම සංහාරය ලෙස සැලකිය හැකිය. දෙවියන් වහන්සේ ඉදිරියෙහි දණින් වැටී සිටි සිය ගණනක අහිංසක බැතිමතුන්ගේ සහ පාස්කු ඉරු දින උදෑසන පාතරාසය භුක්ති විඳිමින් සිටි සිය ගණනකගේත් තවත් අයගේත් ජීවිත අමානුෂික ලෙස විනාශ කරන ලද අතර බොහෝ දෙනෙකුට ශාරීරික හා චිත්තවේගීය වශයෙන් මාරාන්තික තුවාල ඇති විය. සංඛ්‍යාත්මකව, පුද්ගලයන් 315 දෙනෙකුගේ පමණ ජීවිත අහිමි වූ අතර 600 දෙනෙකු[2] පමණ තුවාල ලැබූහ. ළමුන් 45දෙනෙකු සහ විදේශිකයන් 40 දෙනෙකු මිය ගොස් ඇති බව ලෝකයේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වූ අතර එය ඛේදවාචකය පිළිබඳ ජාත්‍යන්තර අවධානය අවදි කළේය. ප්‍රහාරයට ගොදුරු වූ බොහෝ දෙනෙකු තවමත් ප්‍රතිකාර ලබමින් හා ශල්‍යකර්මවලට මුහුණ දෙමින් සිටින අතර මෙම බිහිසුණු අත්දැකීම හේතුවෙන් ඔවුන් මුහුණ දෙන පශ්චාත් ව්‍යසන ආතති ආබාධය (**PTSD**) සඳහා උපදේශන සේවා අවශ්‍ය වේ.පාස්කු ප්‍රහාරයේ අන්ධකාර සෙවණැල්ල ශ්‍රී ලංකා ඉතිහාසයෙන් කිසිදා මැකී නොයනු ඇත. තම ආදරණීයයන් අහිමි වූ වින්දිතයන් යුක්තිය ඉල්ලා සිටින අතරේ තවමත් ඔවුන්ගේ වියෝව ගැන දුක් වෙති.2024 අප්‍රේල් 21 වන දිනට ප්‍රහාරය සිදුවී වසර පහකි. තවමත් යුක්තිය ඉටු වී නැතී අතර විපතට පත් වූ සියලු දෙනා තවමත් එහි අවසානයක් බලාපොරොත්තුවෙන් සිටිති.





සහරාන් හෂීම්ගේ නායකත්වයෙන් යුත් ජාතික තව්හීද් ජමාත් (NTJ) නමින් හැඳින්වෙන ඉස්ලාමීය කණ්ඩායමක් ප්‍රහාරයන්ට වගකිව යුතු බවට තමන් විශ්වාස කරන බව ප්‍රහාරයෙන් පසු දින ශ්‍රී ලංකා බලධාරීන් කියා සිටිය[3]. සති අන්තයේ දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ප්‍රකාශ කළේ ප්‍රහාර පිටුපස සිටි ප්‍රධාන කණ්ඩායම NTJ යැයි විශ්වාස කරන බවය. ප්‍රහාරවලට සම්බන්ධ වූ NTJ මෙන්ම ජමාතෙයි මිල්ලාතු ඊබ්‍රාහිම් (JMI) යන සංවිධාන තහනම් කළ බව නිවේදනය කරන ලදි[4]. කෙසේ වෙතත්, ප්‍රහාරය පිටුපස සිටි අය ගැන සාකච්ඡා කිරීමේදී නොසලකා හැරිය නොහැකි අංගයක් වන්නේ පාස්කු ප්‍රහාරය ශ්‍රී ලංකා රාජ්‍යයේ දැවැන්ත ආරක්ෂක බිඳවැටීමක් නිසා සිදු වූ බවයි[5]. කතෝලික පල්ලිය සහ මානව හිමිකම් ප්‍රජාව ඇතුළු බොහෝ දෙනෙකු විශ්වාස කරන්නේ බෝම්බ ප්‍රහාර පිටුපස ඇති සත්‍යය වසන් කරන බවයි[6] . බුද්ධි අංශ දිගු කලක් තිස්සේ අන්තවාදී කණ්ඩායම් ගැන දැන සිටි බවත්, දේවස්ථානවලට ප්‍රහාරයක් එල්ල විය හැකි බවට පෙර තොරතුරු ලැබී තිබුණු බවටත්[7], ඉහළ නිලධාරීන් පවා එය දැන සිටි බවත්[8], හමුදා බුද්ධි අංශ සහ තවත් සමහර සැකකරුවන් අතර නොපැහැදිලි සබඳතා ඇති බවටත් කරුණු අනාවරණය විය[9]. ප්‍රහාර පිළිබඳ නොසලකා හරින ලද අනතුරු ඇඟවීම්, ප්‍රහාර බාධාවකින් තොරව සිදු කළ ආකාරය සහ යුක්තිය ඉටු කිරීම සඳහා රජයේ පසුගාමී ප්‍රවේශය ප්‍රහාර පිටුපස සිටින සැබෑ මහ මොළකරුවන් කවුරුන්ද යන්න පිළිබඳව ප්‍රශ්න මතු කරයි. මෑතකදී ප්‍රකාශයට පත් කළ චැනල් 04



වාර්තා චිත්‍රපටිය ඉහළ නිලධාරියකුගේ අදාළත්වය සහ රාජපක්ෂ පාලනය සමග ඔහුගේ සබඳතාව ඉස්මතු කරයි.කෙසේ වෙතත, ඉදිරිපත් කර ඇති කරුණු තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය වේ[10]. ප්‍රහාර සඳහා පාර කැපූ තවත් සාධකයක් වන්නේ එවකට රටේ පැවැති දේශපාලන අස්ථාවරත්වයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණය අසාර්ථක වීමෙන් පසු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ අතර පැවති දුර්වල සබඳතාව ජාතික ආරක්ෂාව දුර්වල කර නීති විරෝධී අරමුණු සාර්ථක කිරීමට ඉවහල් විය[11]. අපරාධය කළවුන් තවමත් නිදහස භුක්ති විඳිමින් එළියේ සිටින අතර වින්දිතයන්, දිවි ගලවා ගත් අය සහ ඔවුන්ගේ ආදරණීයයන් තවමත් හිස් බැල්මෙන් යුතුව සුසුම්ලමින් නිශ්චලව සිටිති.දැන් උත්සාහය වන්නේ ප්‍රහාර පිටුපස ඇති සත්‍යය විමර්ශනය කිරීමේ ක්‍රියාවලියට උපකාර කිරීම සඳහා විශ්වාසදායක ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීමයි.

පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන් වෙනුවෙන් යුක්තිය පසිඳලීමේ අදියරේදී රජය විසින් ඉස්ලාමීය කණ්ඩායම් දෙකට සම්බන්ධ බොහෝ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා ලදි.එහෙත්, අත්අඩංගුවට ගත් රාජ්‍ය නිලධාරීන් වන්නේ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සහ හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර පමණි. සාපරාධී නොසැලකිල්ල පිළිබඳ චෝදනා ලැබූ ඔවුන් අධිකරණය විසින් නිදොස් කොට නිදහස් කරන ලදි. ප්‍රහාරයේ වින්දිතයින්ට සහ දිවි ගලවා ගත් අයට මූල්‍යමය වශයෙන් වන්දි ගෙවනු ලැබේ. මූලික අයිතිවාසිකම් පෙත්සම් ආශ්‍රිත වන්දි ආදරණීයයන් අහිමි වූ සහ තුවාල වූ පුද්ගලයින්ගේ පවුල්වලට උපකාර කිරීම සඳහා හානිපූර්ණ කාර්යාලය විසින් කටයුතු කරනු ලැබේ[12]. මූලික අයිතිවාසිකම් පෙත්සම් ආශ්‍රිත වධහිංසන සිද්ධිවලට ලබාදෙනු ලබන වන්දි සමග සන්සන්දනාත්මකව සැලකූ කල මෙම වන්දි අඩු මට්ටමක පවතී. අපරාධවල බරපතලකම සහ දිවි ගලවා ගත් අයගේ, වින්දිතයින්ගේ පවුල්වල සහ විපතට පත් ප්‍රජාවේ විශාල සංඛ්‍යාව සැලකීමේදී මෙය දැකිය හැක. ඊට අමතරව, බොහෝ රාජ්‍ය නොවන සංවිධාන වින්දිතයින්ට ඔවුන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමට සහ ආර්ථික ස්ථාවරත්වයට ළඟා වීමට උපකාර කිරීමේලා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරති. මීට අමතරව පාස්කු ප්‍රහාරයට අදාළව පවරා ඇති නඩු සංඛ්‍යාව ද බොහෝය. නඩු 90කට වඩා පවරා තිබුණද, බොහෝ නඩු තවමත් පවතින්නේ නඩු විභාගයේ ආරම්භක අදියරේය[13]. සමාජය හා සාමයික මධ්‍යස්ථානය විසින් සමීපව නිරීක්ෂණය කරන ප්‍රධාන සිද්ධීන් 12ක් මෙම වාර්තාවේ සාකච්ඡා කෙරේ.



| නඩු අංකය සහ උසාවිය | විස්තර<br>සාරාංශය | අවසන් වරට කැඳවූ දිනය | ඊළඟ දිනය |
|---|---|---|---|
| HC (TAB) 2972/21<br>HC TAB 2972/21<br>කොළඹ මහාධිකරණය | <u>**විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහිව ප්‍රධාන අපරාධ නඩුව.**</u><br><br>පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය ක්‍රියාත්මක කිරීමට කුමන්ත්‍රණය කිරීම, ඊට ආධාර අනුබල දීම ඇතුළු චෝදනා 23,270ක් යටතේ මෙම නඩුව පවරා ඇත.<br><br>*මේ වන විට නඩුව විභාගයේ මූලික අදියරේ පවතී.* | 2024 මාර්තු 27 සහ 28 දිනයන් | 2024 අප්‍රේල් මස 30 වන දින සහ මැයි මස 2 වෙනි දින |
| HC (TAB)2900/21<br>HC (TAB)2899/21<br>**කොළඹ මහාධිකරණය** | <u>**2පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පතිවරයාට සහ ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව පවරා ඇති නඩු**</u><br><br>පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සහ රාජකාරී පැහැර හැරීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු යන අයට අධිචෝදනා ගොනු කරන ලදි. කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල ඒකමතිකව ඔවුන් වෙනුවෙන් සාක්ෂි කැඳවීමකින් තොරව ඔවුන් නිදොස් කොට නිදහස් කිරීමට නියෝග කළේය. මෙම නඩුව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර මේ වන විට තීන්දුව ලබා දීමට නියමිතය | **සැප්තැම්බර් 8 2023** | - |
| පාස්කු ප්‍රහාරයට අදාළ මූලික අයිතිවාසිකම් විභාග යන් 12 ශ්‍රේෂ්ඨාධිකරණය | පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ පුද්ගලයන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු 12ක් පවරා ඇත. එම පෙත්සම්වල නම් කර ඇති වගඋත්තරකරුවන්ට ආසන්නයේදී සිදු විය හැකි ප්‍රහාරයක් පිළිබඳ විශ්වසනීය තොරතුරු තිබියදීත් පාස්කු ඉරිදා ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ බවත්, එමගින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. තීන්දුවට අනුකූල වීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග reparation.gov'lk වෙබ් අඩවියෙන් සොයාගත හැකිය. | 2023 නොවැම්බර් 02 | 2024 ජූලි 15 |

| | | | |
|---|---|---|---|
| HC78/2021<br>පුත්තලම මහාධිකරණය | **<u>හෙජාස් හිස්බුල්ලා සහ තවත් අයට එරෙහි නඩුව</u>**<br><br>පාස්කු ප්‍රහාරයේ බෝම්බ ප්‍රහාරකයකු සමඟ සබඳතා පැවැත්වූ සේව් ද පර්ල්ස් පුණ්‍යායතනයට සම්බන්ධ යැයි කියන නීතීඥ හිජාස් හිස්බුල්ලාට එරෙහිව මෙම නඩුව පවරා තිබේ. දැනට, නඩු විභාගය සිදු වෙමින් පවතී. කෙසේ වෙතත්, හෙජාස්ට එරෙහි සාක්ෂි දුර්වල මට්ටමක පවතී | 2024 මාර්තු 1 | 2024 මැයි 17 |
| 23084/22<br>කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය | **<u>මෛත්‍රීපාල සිරිසේනට එරෙහිව පෞද්ගලික පැමිණිල්ලක්</u>**<br><br>චෝදනාවවූයේ නොසැලකිලිමත්කමෙන් මරණයට පත් කිරීම සහ/හෝ බරපතළ තුවාල සිදුකිරීම සම්බන්ධ දණ්ඩ නීති සංග්‍රහයේ වරද සම්බන්ධයෙනි. එය දැනට රිට් පෙත්සමේ නියෝගය නිකුත් කරන තුරු අත්හිටුවා ඇත. | 17th මාර්තු 2023 | - |
| Writ 354/22<br>රිට් පෙත්සම<br>අභියාචනාධිකරණය | **<u>හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ගොනු කර ඇත.</u>**<br><br>2022 ඔක්තොම්බර් මස 14 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසට මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඔහුට සිතාසි නිකුත් කරමින් කර ඇති නියෝගය නීතිවිරෝධී, බල රහිත සහ නීතිමය බලපෑමක් නොමැති බවට චෝදනා කරමින් බවරා ඇත. දැනට, මෙය මීළඟ දිනය සඳහා නියම කර ඇත | 2024 පෙබරවාරි 07 | 2024 මැයි 14 |

| | | | |
|---|---|---|---|
| TAB 4485/21<br>කෑගල්ල මහාධිකරණය | **<u>TAB</u>** <u>4485/21 කෑගල්ල මහාධිකරණය</u><br><u>පුත්තලම/**TAB** 107/2021</u><br><u>පුත්තලම මහාධිකරණය</u><br>**<u>HC</u>** <u>148/2021</u><br><br>මාවනැල්ල බුදු පිළිම විනාශ කිරීමේ නඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (ඡ්ඕ) යටතේ විත්තිකරුවන් 16 දෙනෙකුට එරෙහිව මෙම නඩුව පවරා ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ චෝදනා දණ්ඩ නීති සංග්‍රහය යටතේ වූ වැරදි බවට අඩු කිරීමෙන් පසු සියලු විත්තිකරුවන් වරද පිළිගත්හ.. මෙම විනාශය පිටුපස සිටි පුද්ගලයා පාස්කු ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු වූ සහරාන් හෂීම් බව පසුව අනාවරණය විය. මෙම නඩුව 2023 ජනවාරි 18 වන දින අවසන් කරන ලද අතර විත්තිකරුවන්ට අත්හිටවූ සිරදඬුවම් නියම විය. | 18 ජනවාරි 2023 | නඩුව අවසන් |
| පුත්තලම/TAB 107/2021<br>පුත්තලම මහාධිකරණය | <u>වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය නඩුව</u><br><br>වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය නඩුව මෙම නඩුව පාස්කු ප්‍රහාරයට සම්බන්ධව වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයාගත් පුහුණු කඳවුරක් සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙනි. මේ වන විට, පාපොච්චාරණය ස්වේච්ඡාවෙන් ලබාදුන් එකක්ද, බලහත්කාරයෙන් ලබා ගත්තේද යන්න පරීක්ෂා කිරීම සඳහා වැඩිදුර විමර්ශනය (voir dire enquiry) සිදුවෙමින් පවතී. | 30 සහ 31 ජනවාරි | 2024 28 & 29 මැයි, 25, 26 & 27 ජූනි and 16t,17 & 18 ජූලි. |
| HC 148/2021<br>පුත්තලම මහාධිකරණය | <u>අහ්නාෆ් ජෙසීම්ට එරෙහි නඩුව</u><br><br>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PT) යටතේ තරුණ කවියෙකු වන අහනාෆ් ජෙසීම්ට එරෙහිව මෙම නඩුව පවරා ඇත. මාස 19ක් රඳවාගෙන සිටි අහ්නාෆ්ට ඇප ලැබී ඇති අතර සාක්ෂි නොමැතිකම හේතුවෙන් අත්අඩංගුවට ගෙන මාස 43කට පසු නිදොස් කොට නිදහස් කර නඩුව අවසන් වී ඇත. | 12 දෙසැම්බර් 2023 | නඩුව අවසන් |

| | | | |
|---|---|---|---|
| 16235/MR<br>මීගමුව දිසා අධිකරණය | <u>**සිවිල් නඩු**</u><br><br>පාස්කු ප්‍රහාරයෙන් සිදුවූ හානි අයකර ගැනීමේ නඩුව. දැනට එය පූර්ව විභාග අදියරේ පවතී. | 02nd February 2024 | 28th June 2024 |
| 143/24 රිට් පෙත්සම අභියාචනාධිකරණය | <u>**සමාජය සහ සාමයික කේන්ද්‍රය (CSR), එහි අධ්‍යක්ෂ සහ වින්දිතයෙකු විසින් ගොනු කරන ලද රිට් පෙත්සම.**</u><br><br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතාට එරෙහිව අපරාධ පරීක්ෂණ කටයුතු සහ නඩු කටයුතු ආරම්භ කරන ලෙස පොලිස්පතිවරයාට සහ නීතිපතිවරයාට නියෝග කරමින් මැන්ඩමස් රිට් ආඥාවක් ඉල්ලා සිටී. දැනට, මෙම නඩුව 2024 මැයි 28 වන දින කැඳවීමට නියමිතය. | 27th March 2024 | 28th May 2024 |
| CA RTI/11/2023<br>අභියාචනාධිකරණය | <u>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයට එරෙහිව RTI නඩුවක්**</u><br><br>පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වත්මන් පොලිස්පතිවරයා ඇතුළු ඇතැම් පොලිස් නිලධාරීන්ගේ අතපසුවීම් සම්බන්ධයෙන් ගෙන ඇති විනය ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉල්ලා CSR විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය (සඅමෂ) මත පදනම් වූ ඉල්ලීමක් ගොනු කර ඇත. මේ වන විට මෙම කාරණය අභියාචනාධිකරණය හමුවේ පවතී | 05th March 2024 | 14th June 2024 |
| | | | |

*සවිස්තර වශුව පහත දැක්වෙන වාර්තාවේ ඇත: සමාජය සහ සාමයික කේන්ද්‍රය. "පාස්කු ප්‍රහාර ප්‍රධාන උසාවි නඩු 11 ක විශේෂ අවස්ථා (2021 ජනවාරි 1 සිට 2023 ජූනි 21)." සමාජය සහ සාමයික කේන්ද්‍රය, 21 ජූනි 2023. https(//easterattack'info/csr-report/.

මෙම වාර්තාව පාස්කු ප්‍රහාරය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. දේශපාලන සන්දර්භය ප්‍රකාශ කිරීම, වින්දිතයන්ගේ නියැදියක් පිළිබඳ අවබෝධයක් ලබා දීම, සමාජ-සංස්කෘතික හා ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කිරීම, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නීතිමය උපදේශනයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සහ යුක්තිය ඉටු වී නොමැති ආකාරය විශ්ලේෂණය කිරීම එමගින් සිදු කෙරේ.

1 "Sri Lanka Attacks: What We Know about the Easter Bombings." BBC News, BBC, 28 Apr. 2019, www.bbc.com/news/world-asia-48010697.

2"Written statement* submitted by Franciscans International, a non-governmental organization in general consultative status." United Nations, 5 Feb. 2024.

3 "Sri Lanka Attacks: What We Know about the Easter Bombings." BBC News, BBC, 28 Apr. 2019, www.bbc.com/news/world-asia-48010697.

4"VOA News. "Sri Lankan Police Enter HQ of Group Blamed for Easter Attacks." Voice of America, 28 Apr. 2019, www.voanews.com/a/sri-lankan-police-enter-hq-of-group-blamed-for-easter-attacks/4894829.html.

5 "After Sri Lanka's Easter Bombings: Reducing Risks of Future Violence." Crisis Group, 17 Feb. 2021, www.crisisgroup.org/asia/south-asia/sri-lanka/302-after-sri-lankas-easter-bombings-reducing-risks-future-violence.

6 Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

7"CSR officially receives four most important evidence given at the Presidential Commission of Inquiry on the Easter Attacks': Further established that the security forces had prior information of the bombers." Centre for Society and Religion, 19 Jan. 2024.

8"SC FR 163/2019." Supreme Court, https://www.supremecourt.lk/images/documents/sc_fr_163_2019.pdf. Accessed 28 Mar. 2024.

9Sri Lanka Brief. "Easter Sunday Attacks in Sri Lanka: Accountability, Justice, and the Deep State." Sri Lanka Briefing Notes, no. 24, Feb. 2022, pp. 3–24, https://srilankabrief.org/briefing-note-easter-sunday-attacks-in-sri-lanka-accountability-justice-and-the-deep-state/.

10 "Channel 4- Why Now? Why Not?", The Island, 10 Sept 2023, https://island.lk/channel-4-why-now-why-not/

11 Radhakrishnan, R K. "Constitutional Coup." Frontline, 10 Nov. 2018, https://frontline.thehindu.com/world-affairs/article25436345.ece

12 'Actions taken by or on orders made by the Supreme Court', Office for Reparations Sri Lanka. https://reparations.gov.lk/web/index.php?option=com_content&view=article&id=153:action-taken-by-or-on-orders-made-by-the-supreme-court&catid=8:news-and-events&lang=en&Itemid=282

13 Centre for Society and Religion. "The Highlights of 11 Main Easter Attacks Court Cases (1st January 2021- 21st June 2023)," Centre for Society and Religion, 21st June 2023. https://easterattack.info/csr-reports/.



CSR
CENTRE FOR SOCIETY & RELIGION

# EA INFO

Easter Attack Info

https://easterattack.info